## කුසලා පදයේ පද අර්ථ විවරණය (අත්ථසාලිනී මාතිකා වර්ණනාවෙන්)

1. කුච්ඡිතෙ පාපකෙ ධම්මෙ සලයන්ති චලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්තීති කුසලා.
    - කු+සල යනුවෙන් පද බෙදා ගත යුතු ය
    - ක්‍රම දෙකකින් පැහැදිලි කළ හැක
    - <u>පළමු ක්‍රමය</u>
        - කු - කුච්ඡිතෙ; කුච්ඡිත - පාපක
        - සලා - සල ධාතුව
            - භූ - චලන, සංවර, ගති, වෙග
            - චු - ඡොමන
            - චලන අර්ථය ගැනීම සඳහා 'චලයන්ති' යනුවෙන් දැක්වීය.
        - චලයන්ති
            - චල ධාතුව
            - භූ - කම්පා, විලාස, ගති
            - චු - පොසන
            - කම්ප - අර්ථය ගැනීම සඳහා 'කම්පෙන්ති' යනුවෙන් දැක්වීය.
        - කම්පෙන්ති
            - කපි ධාතුව
            - භූ - තක්කල, ගන්ධ, හිංසා, සඤ්චල, සත්ති
            - චු - ගතියං
            - හිංසා (විද්ධංසන) අර්ථය ගැනීම සඳහා 'විද්ධංසෙන්ති' යනුවෙන් දැක්වීය.
    - <u>දෙවන ක්‍රමය</u>
        - සලයන්ති පදය ම 'චලයන්ති කම්පෙන්ති විද්ධංසෙන්ති' යනුවෙන විවරණය කරන ලදී.
            - චලයන්ති - තදංග ප්‍රහාණය (කාමාවචර කුසල)
            - කම්පෙන්ති - විශ්කම්භන ප්‍රහාණය (මහද්ගත කුසල)
            - විද්ධංසෙන්ති - සමුච්ඡේද ප්‍රහාකය (ලෝකෝත්තර කුසල)

2. කුච්ඡිතෙන වා ආකාරෙන සයන්තීති කුසා. තෙ අකුසලසඞ්ඛාතෙ කුසෙ ලුනන්ති ඡින්දන්තීති කුසලා.
    - කුස+ලා යනුවෙන් බෙදා ගත යුතු ය.
    - කුස පදය
        - කු+ස යනුවෙන් බෙදා ගත යුතු ය.
        - කුච්ඡිතෙන සයන්තීති කුසා යනුවෙන් විග්‍රහ කර ගත යුතු ය. මෙම කොටස සඳහා ස්වරූපාර්ථ වනුයේ අකුසල ධර්මයන් ය. එම අකුසල ධර්මයන් සත්වයන්ගේ සන්තානයෙහි පිළිකුල් ආකාරයෙන් ලගියි.
    - ලා
        - ලා ධාතුව
        - ලා ධාතුව ඡේදන අර්ථයෙහි වැටේ. එබැවින් 'ඡින්දන්ති' යනුවෙන් විවරණය කෙරිණ.

3. කුච්ඡිතානං වා සානතො තනුකරණතො ඔසානකරණතො ඤාණං කුසං නාම. තෙන කුසෙන ලාතබ්බාති කුසලා; ගහෙතබ්බා පවත්තෙතබ්බාති අත්ථො.
    - කුස+ල යනුවෙන් බෙදා ගත යුතු ය.
    - මෙහි 'කුස' සඳහා පෙර මෙන් අකුසලයන් නොගෙන ඤාණය ගත යුතු වේ.
    - කු+ස යනුවෙන් පද බෙදා ගත යුතු ය.
        - කු යන්නෙන් පෙර මෙන් අකුසලයන් ගත යුතු වේ.
        - සා
            - සා ධාතුව යි.
            - සා ධාතුව + අ ප්‍රත්‍යය
            - ස ධාතුව සඳහා භූ, දි, ගහාදි යන ගණයන් සඳහා ම 'තනුකරණ සහ අවසාන' යන අර්ථයන් දෙක ඇත. එබැවින් 'තනුකරණතො, ඔසානකරණතො' යනුවෙන් දැක්වීය
            - එම ලා ධාතුව ගහණ අර්ථය දක්වන බැවින් 'ගහෙතබ්බා' යනුවෙන් විවරණය කෙරිණ.
            - 'ගහෙතබ්බා' යන්නෙන් අදහස් කරන ගැනීම නම් ඤාණය විසින් කුසල ධර්මයන් පහළ කරවීම යි. එබැවින් එම පහළ කරවීම දැක්වීම සඳහා 'පවත්තෙතබ්බා' යනුවෙන් විවරණය කෙරිණ.

4. යථා වා කුසා උභයභාගගතං හත්ථප්පදෙසං ලුනන්ති, එවමිමෙපි උප්පන්නානුප්පන්නභාවෙන උභයභාගගතං කිලෙසපක්ඛං ලුනන්ති. තස්මා කුසා විය ලුනන්තීතිපි කුසලා.
    - කුස+ල යනුවෙන් බෙදා ගත යුතු ය.
    - ලූ ධාතුව + අ ප්‍රත්‍යය
    - කුසාවිය ලුනන්තීති කුසලා යනුවෙන් අටුවා ක්‍රමයෙන් විග්‍රහ කරගන්න.